# සතිපතා
# ආර්ථික දර්ශක



## 2024 අගෝස්තු 30

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2024 ජූලි මාසයේ පැවති සියයට 2.4හි සිට 2024 අගෝස්තු මාසයේ දී සියයට 0.5ක් දක්වා තියුණු ලෙස පහළ ගියේය. 2024 ජූලි මාසයේ දී ආහාර කාණ්ඩය වාර්තා කළ උද්ධමනය සියයට 0.8ක් වූ අතර ආහාර නොවන කාණ්ඩය වාර්තා කළ උද්ධමනය සියයට 0.4ක් විය. තවද, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2024 ජූලි මාසයේ පැවති සියයට 4.4හි සිට 2024 අගෝස්තු මාසයේ දී සියයට 3.6ක් දක්වා පහළ ගියේය.

2024 ජූලි මාසයේ දී, ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ලෙස හඳුන්වනු ලබන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය මගින් පෙර මාසයට සාපේක්ෂව ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි .

2024 අගෝස්තු 24 සහ අගෝස්තු 30 අතර වූ කාලපරිච්ඡේදය තුළ දී, සැපයුම සහ ඉල්ලුම පිළිබඳ අවිනිශ්චිතතා හේතුවෙන් බොරතෙල් මිල ගණන් දැඩි ලෙස විචලනය විය. මැද පෙරදිග සහ ලිබියාවේ වර්ධනය වන අර්බුද හේතුවෙන් සැපයුම් බාධා ඇතිවනු ඇතැයි පැවති අවිනිශ්චිතතා මධ්‍යයේ මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ සහ චීනයේ මන්දගාමී ආර්ථික වර්ධනය නිසා බලශක්ති සඳහා ඉල්ලුම අඩු වනු ඇතැයි පැවති අපේක්ෂා හේතුවෙන් මෙම ඉහළ යෑම සීමා විය. සමස්තයක් ලෙස, මෙම කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි බොරතෙල් බැරලයක මිල, පිළිවෙළින් එ.ජ.ඩොලර් 0.50කින් සහ එ.ජ.ඩොලර් 0.57කින් ඉහළ ගියේය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2024 අගෝස්තු මස 30 වන දිනෙන් අවසාන වන සතිය සඳහා සියයට 9.13හි නොවෙනස්ව පවතී.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පෙර සතියේ අග පැවති සියයට 8.57ට සාපේක්ෂව 2024 අගෝස්තු මස 30 වන දින සියයට 8.75ක් විය.

සංසරණයේ පවතින මුදල් ප්‍රමාණය සහ වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය පහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් පහළ ගියේය.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 33.979ක අතිරික්තයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 71.043ක අතිරික්තයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2024 අගෝස්තු මස 30 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 4.34කින් දර්ශක අගය 10,869.07ක් දක්වා පහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 6.01කින් දර්ශක අගය 3,058.60ක් දක්වා පහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

මෙම සතිය තුළ, දින 364 භාණ්ඩාගාර බිල්පත හැර අනෙකුත් බිල්පත් හි ප්‍රාථමික වෙළඳපොළ ඵලදා අනුපාතික සුළු ඉහළ යාමක් දක්නට ලැබුණු අතර ද්විතීයික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පැවතුණි .

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 3.4ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය , ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් දෙගුණයකට ආසන්න වේ.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 11ක ඉහළ යාමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය

2024 වසරේ අගෝස්තු 30 වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 7.9කින් අතිප්‍රමාණය විය.

2024 වසරේ ජූලි මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 5,652ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් මෙහි අන්තර්ගත වන අතර , එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

2024 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ .ජ. ඩොලර් මිලියන 7,275ක් දක්වා සියයට 5.6කින් ඉහළ ගිය අතර, මේ සඳහා අපනයන කාණ්ඩ අතරින් ඛනිජ තෙල් නිෂ්පාදිත (119.8%), ආහාර, පාන වර්ග හා දුම්කොළ (22.2%), තේ (8.1%), රබර් නිෂ්පාදිත (10.2%), සහ පොල් ආශ්‍රිත නිෂ්පාදිත (19.5%) ආදී වූ අපනයන ආදායම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය . 2024 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ .ජ.ඩොලර් මිලියන 10,419ක් දක්වා සියයට 9.1කින් ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, යන්ත්‍රසූත්‍ර හා උපකරණ (25.6%), රෙදිපිළි හා රෙදිපිළි උපාංග (15.5%), රසායනික නිෂ්පාදිත (24.4%) සහ ගොඩනැගිලි ද්‍රව්‍ය (25.9%) ආදී වූ ආනයන ඉහළ යෑම මේ සඳහා හේතු විය . ඒ අනුව, 2024 වසරේ ජූලි මාසයෙන් අවසාන වන මාස හත තුළ දී වෙළඳ හිඟය , 2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,657ක සිට එ.ජ. ඩොලර් මිලියන 3,144ක් දක්වා පුළුල් විය.

කාර්මික භාණ්ඩ අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2024 වසරේ ජූලි මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.3කින් පහළ ගියේය. 2024 වසරේ ජූලි මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.2කින් පහළ ගිය අතර, මේ සඳහා ආයෝජන භාණ්ඩ ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය . මේ අනුව, 2024 වසරේ ජූලි මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 89.3ක් දක්වා සියයට 1.1කින් පහළ ගියේය.


තේ සඳහා වෙන්දේසි මිලෙහි සාමාන්‍යය (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2023 වසරේ ජූලි මාසයේ පැවති කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 3.18ක සිට 2024 වසරේ ජූලි මාසයේ දී කිලෝග්‍රෑමයට එ.ජ. ඩොලර් 4.09ක් දක්වා ඉහළ ගියේය. මේ අතර 2023 වසරේ ජූලි මාසයේ දී බොරතෙල් සඳහා පැවති ආනයන මිලෙහි සාමාන්‍යය වූ බැරලයකට එ.ජ. ඩොලර් 81.29ක සිට 2024 වසරේ ජූලි මාසයේ දී, බැරලයකට එ.ජ. ඩොලර් 87.57ක් දක්වා ඉහළ ගියේය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක

| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2023 ජූලි | 2024 ජූනි | 2024 ජූලි |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 201.9 | 208.1 | 206.9 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.7) | 0.9 | (0.6) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 3.0 | 2.9 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 4.6 | 2.4 | 2.5 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 188.0 | 193.7 | 193.7 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 2.7 | 2.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 6.3 | 3.9 | 3.0 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2023 අගෝස්තු | 2024 ජූලි | 2024 අගෝස්තු |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 190.1 | 194.7 | 191.1 |
| මාසික ප්‍රතිශත වෙනස % | (0.1) | (0.5) | (1.8) |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 2.8 | 2.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 4.0 | 2.4 | 0.5 |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 171.2 | 177.9 | 177.3 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 2.7 | 2.7 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 4.6 | 4.4 | 3.6 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
|---|---|---|---|---|---|---|---|---|
| සම්බා | 213.33 | 230.00 | 230.00 | 231.20 | 223.33 | 240.00 | 240.00 | 240.00 |
| රතු කැකුළු | 159.33 | 195.00 | 198.50 | 202.00 | 168.33 | 210.00 | 210.00 | 210.00 |
| | | | | | | | | |
| බෝංචි | 383.33 | 450.00 | 262.50 | 280.00 | 433.33 | 500.00 | 312.50 | 330.00 |
| ගෝවා | 140.00 | 298.00 | 180.00 | 172.00 | 193.33 | 348.00 | 235.00 | 222.00 |
| කැරට් | 300.00 | 288.00 | 185.00 | 180.00 | 350.00 | 338.00 | 235.00 | 228.00 |
| තක්කාලි | 113.33 | 196.00 | 140.00 | 156.00 | 166.67 | 246.00 | 190.00 | 206.00 |
| වට්ටක්කා | 70.00 | 160.00 | 135.00 | 86.00 | 100.00 | 200.00 | 185.00 | 126.00 |
| පතෝල | 123.33 | 164.00 | 162.50 | 184.00 | 166.67 | 206.00 | 212.50 | 234.00 |
| වම්බටු | 230.00 | 290.00 | 205.00 | 220.00 | 286.67 | 340.00 | 255.00 | 270.00 |
| අමු මිරිස් | 600.00 | 400.00 | 150.00 | 170.00 | 650.00 | 450.00 | 200.00 | 220.00 |
| දෙහි | 933.33 | 500.00 | 375.00 | 220.00 | 1,033.33 | 600.00 | 425.00 | 270.00 |
| | | | | | | | | |
| රතු ළූණු ( දේශීය) | 245.33 | 336.20 | 265.75 | 275.00 | 306.67 | 370.00 | 350.00 | 350.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 190.33 | 181.40 | 201.00 | 222.60 | 210.00 | 232.00 | 232.50 | 264.00 |
| අර්තාපල් ( දේශීය) | 318.33 | 391.40 | 382.50 | 355.40 | 346.67 | 454.00 | 430.00 | 400.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,019.33 | 779.80 | 775.00 | 750.00 | 1,160.00 | 850.00 | 850.00 | 850.00 |
| රතු පරිප්පු | 286.67 | 277.00 | 275.00 | 270.40 | 306.67 | 300.00 | 300.00 | 292.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | 43.00 | 39.60 | 40.25 | 42.80 | 43.50 | 40.60 | 40.75 | 43.30 |
| පොල් ( ගෙඩියක මිල) | 80.00 | 95.00 | 102.75 | 105.00 | 120.00 | 120.00 | 120.00 | 120.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
|---|---|---|---|---|
| සම්බා | 209.00 | 225.80 | 221.00 | 221.00 |
| සුදු කැකුළු | 178.00 | 197.00 | 197.00 | 197.60 |
| රතු කැකුළු | 168.00 | 191.60 | 192.00 | 195.00 |
| නාඩු | 190.67 | 206.80 | 205.00 | 207.40 |

ලැ.නො. - ලැබී නොමැත.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 240.00 | 260.00 |
| රතු කැකුළු | 195.00 | 199.00 |
| බෝංචි | 347.50 | 311.00 |
| ගෝවා | 132.50 | 146.00 |
| කැරට් | 170.00 | 181.00 |
| තක්කාලි | 128.75 | 131.00 |
| වට්ටක්කා | 64.00 | 46.80 |
| පතෝල | 118.75 | 145.00 |
| වම්බටු | 130.00 | 153.00 |
| අළු කෙසෙල් | 190.00 | 176.00 |
| රතු ළූණු ( දේශීය) | 196.67 | 196.00 |
| රතු ළූණු ( ආනයනික) | 310.00 | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 208.25 | 236.20 |
| අර්තාපල් (දේශීය) | 315.00 | 287.50 |
| අර්තාපල් ( ආනයනික) | 163.50 | 162.20 |
| වියළි මිරිස් ( ආනයනික) | 670.00 | 653.00 |
| පොල් ( ගෙඩියක මිල) | 83.75 | 85.60 |

## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සුදු නාඩු | 220.00 | 220.00 |
| රතු කැකුළු | 210.00 | 210.00 |
| බෝංචි | 475.00 | 480.00 |
| ගෝවා | 390.00 | 376.00 |
| කැරට් | 360.00 | 344.00 |
| තක්කාලි | 300.00 | 280.00 |
| වට්ටක්කා | 190.00 | 156.00 |
| පතෝල | 355.00 | 332.00 |
| වම්බටු | 400.00 | 376.00 |
| අමු මිරිස් | 500.00 | 420.00 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | 480.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 260.00 | 268.00 |
| අර්තාපල් ( දේශීය) | 560.00 | 560.00 |
| අර්තාපල් ( ආනයනික) | 220.00 | 212.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 850.00 | 850.00 |
| රතු පරිප්පු | 300.00 | 300.00 |
| සුදු සීනි | 260.00 | 260.00 |
| බිත්තර- සුදු ( එකක මිල) | 44.00 | 45.00 |
| පොල් ( ගෙඩියක මිල) | 130.00 | 130.00 |

### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල




## 1.2.5 මාළු වෙළඳපොළ

| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 1,425.00 | 1,260.00 | 1,175.00 | 1,140.00 | 1,740.00 | 1,740.00 | 2,350.00 | 2,380.00 |
| බලයා | 837.50 | 732.50 | 720.00 | ලැනො. | 900.00 | ලැනො. | 1,100.00 | 1,040.00 |
| සාලයා | 417.50 | 320.00 | 347.50 | 266.00 | 472.50 | 400.00 | 555.00 | 484.00 |
| හුරුල්ලා | 750.00 | 760.00 | 786.67 | 767.50 | 953.33 | 950.00 | 940.00 | 1,044.00 |


ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | පළමු කාර්තුව | |
|---|---|---|---|---|
| | 2022 (අ)(ආ) | 2023 (ආ) | 2023 (අ)(ආ) | 2024 (ආ) |
| කෘෂිකාර්මික | (4.2) | 2.6 | 1.6 | 1.1 |
| කාර්මික | (16.0) | (9.2) | (24.3) | 11.8 |
| සේවා | (2.6) | (0.2) | (4.6) | 2.6 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | (12.4) | 2.8 | (13.7) | 10.0 |
| දළ දේශීය නිෂ්පාදිතය | (7.3) | (2.3) | (10.7) | 5.3 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූර්ත දළ දේශීය නිෂ්පාදිතය





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | ජූනි | | % වෙනස |
|---|---|---|---|
| | 2023 (අ) | 2024 (අ) | |
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 23.0 | 23.0 | 0.1 |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 6.1 | 4.7 | (23.6) |
| පොල් (ගෙඩි මිලියන) | 257.1 | 274.9 | 6.9 |

(අ) තාවකාලික

තේ නිෂ්පාදනය





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | ජූනි | | % වෙනස |
|---|---|---|---|
| | 2023 (ආ) | 2024 (ඇ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 90.1 | 93.0 | 3.3 |
| ආහාර නිෂ්පාදන | 87.3 | 103.0 | 17.9 |
| ඇඟලුම් නිෂ්පාදන | 91.8 | 82.0 | (10.6) |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 92.7 | 99.1 | 7.0 |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 117.7 | 80.7 | (31.4) |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 78.6 | 80.3 | 2.3 |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 73.7 | 81.1 | 10.0 |
| පාන වර්ග | 121.3 | 116.5 | (3.9) |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

කාර්මික නිෂ්පාදන දර්ශකය




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | ජූනි | ජූලි | ජූනි | ජූලි |
| දර්ශකය | 47.3 | 44.6 | 56.6 | 59.5 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | ජූනි | ජූලි | ජූනි | ජූලි |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය | 61.9 | 67.5 | 63.5 | 71.1 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| | ජූනි | ජූලි | ජූනි | ජූලි |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 44.4 | 43.2 | 59.5 | 62.9 |

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක හරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සැසඳිය හැකිය.


ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන




ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා




ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම්




## 1.7 සේවා නියුක්තිය (අ)

| අයිතමය | 2023 | 2023 කාර්තු:1 | 2024 කාර්තු:1 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 48.6 | 49.9 | 47.1 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.7 | 4.7 | 4.5 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්(ආ) (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2023 | 2023 කාර්තු:1 | 2024 කාර්තු:1 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.1 | 26.7 | 25.8 |
| කර්මාන්ත | 25.5 | 25.5 | 24.7 |
| සේවා | 48.4 | 47.8 | 49.5 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2023 ජූලි | 2024 ජූලි | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 133.1 | 161.3 | 21.2 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 171.0 | 180.8 | 5.7 |
| කෘෂිකර්මාන්ත | 170.5 | 182.1 | 6.8 |
| කර්මාන්ත | 170.8 | 179.1 | 4.9 |
| සේවා | 172.0 | 183.2 | 6.5 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2023 ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2024 ලං.ඛ.නි.සං. ආනයන මිල (මි.ර.ගැ) (බැරලයක් එ.ජ. ඩොලර්) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 84.28 | 78.60 | 97.93 | 78.93 | 73.64 | 91.48 |
| පෙබරවාරි | 83.52 | 76.97 | - | 81.48 | 76.53 | 81.33 |
| මාර්තු | 78.93 | 73.05 | 84.05 | 84.57 | 80.23 | 82.76 |
| අප්‍රේල් | 83.09 | 79.10 | 90.49 | 88.99 | 84.47 | 86.00 |
| මැයි | 76.05 | 72.05 | 86.90 | 83.28 | 78.97 | 88.49 |
| ජූනි | 74.85 | 70.13 | 90.90 | 82.58 | 78.42 | 92.88 |
| ජූලි | 79.90 | 75.52 | 81.29 | 84.14 | 80.85 | 87.57 |
| අගෝස්තු | 85.09 | 81.28 | 81.53 | 79.03 | 75.71 | |
| සැප්තැම්බර් | 91.89 | 88.72 | - | | | |
| ඔක්තෝබර් | 89.19 | 86.16 | 88.98 | | | |
| නොවැම්බර් | 82.22 | 77.58 | 99.98 | | | |
| දෙසැම්බර් | 77.53 | 72.36 | 97.62 | | | |

| දිනය | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| 24-08 | 83.06 | 78.69 | - | - |
| 25-08 | 83.40 | 79.11 | - | - |
| 26-08 | - | - | 79.58 | 75.41 |
| 27-08 | - | - | 81.12 | 77.09 |
| 28-08 | 84.76 | 80.13 | 79.90 | 75.79 |
| 29-08 | 84.30 | 79.95 | 78.76 | 74.70 |
| 30-08 | - | - | 80.08 | 75.98 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2024-08-26 | 2024-08-27 | 2024-08-28 | 2024-08-29 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,504.70 | 2,553.40 | 2,535.90 | 2,553.30 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ) | 46.27 | 47.62 | 48.88 | 48.67 |
| ජල | 15.51 | 15.40 | 15.55 | 13.68 |
| ගල් අඟුරු | 19.65 | 19.39 | 19.55 | 19.58 |
| තෙල් | 3.49 | 5.38 | 6.97 | 8.07 |
| සුළං | 4.74 | 4.54 | 4.02 | 4.55 |
| සූර්ය (තොග) | 2.59 | 2.73 | 2.59 | 2.60 |
| ජෛව ස්කන්ධය | 0.30 | 0.18 | 0.21 | 0.18 |




මූලය: ලංකා විදුලිබල මණ්ඩලය


(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නි.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නි.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ සෘජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නි.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතික | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 11.00 | 8.25 | 8.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 12.00 | 9.25 | 9.25 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 11.50 | 8.57 | 8.75 |
| **භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 18.48 | 9.42 | 9.49 |
| දින 182 | 15.36 | 9.80 | 9.84 |
| දින 364 | 13.58 | 10.01 | 10.01 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 15.29 | 9.13 | 9.13 |

ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ එක්දින මුදල් වෙළෙඳපොළ අනුපාතික




| | 2023 ජූනි | 2024 මැයි | 2024 ජූනි |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 12.00 | 0.25 - 9.00 | 0.25 - 9.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 1.00 - 24.80 | 2.50 - 21.00 | 2.50 - 21.00 |

| | 2023 අගෝස්තු | 2024 ජූලි | 2024 අගෝස්තු |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 14.15 | 8.04 | 7.87 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 18.26 | 9.90 | 9.67 |

| | 2023 ජූලි | 2024 ජූනි | 2024 ජූලි |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 12.45 | 7.24 | 7.32 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 12.76 | 7.32 | 7.39 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 16.90 | 12.47 | 12.25 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 19.30 | 11.45 | 11.52 |

| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2023 ජූලි | 2024 ජූනි | 2024 ජූලි |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 7.75 | 7.75 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 04 මාස 10 2024 අගෝස්තු 13 | වසර 08 මාස 02 2024 අගෝස්තු 13 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 11.75 | 9.00 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 12.98 | 13.25 |


### බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව


| | සතියකට පෙර | මෙම සතිය | | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 9.15 | 9.41 | කාර්ගිල්ස් බැංකුව | 9.59 | 9.25 |
| මහජන බැංකුව | 9.90 | 9.12 | එච්එස්බීසී බැංකුව | 9.41 | 9.42 |
| හැටන් නැෂනල් බැංකුව | 8.79 | 9.11 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 9.01 | 9.18 |
| කොමර්ෂල් බැංකුව | 9.88 | 9.16 | සිටි බැංකුව (අ) | 10.50 | 10.50 |
| සම්පත් බැංකුව | 8.74 | 10.93 | ඩොයිෂ් බැංකුව | 8.76 | 8.73 |
| සෙලාන් බැංකුව | 10.63 | 9.89 | හබීබ් බැංකුව (අ) | 9.47 | 9.47 |
| යූනියන් බැංකුව | 9.30 | 8.91 | ඉන්දියන් බැංකුව | 9.97 | 9.97 |
| පෑන් ඒෂියා බැංකුව | 8.73 | 8.82 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව (අ) | 9.58 | 9.58 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 8.95 | 8.92 | එම්සීබී බැංකුව | 8.97 | 9.13 |
| ඩීඑෆ්සීසී බැංකුව | 9.62 | 9.69 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 10.10 | 10.75 |
| එන්ඩීබී බැංකුව (අ) | 9.29 | 9.29 | පබ්ලික් බැංකුව (අ) | 8.57 | 8.57 |
| අමානා බැංකුව | 8.60 | 8.66 | බෑන්ක් ඔෆ් චයිනා | - | - |


(අ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | ජුනි 2023 (අ) | මැයි 2024 | ජුනි 2024 (ආ) | ජුනි 2023 (අ) | මැයි 2024 | ජුනි 2024 (ආ) |
| සංචිත මුදල් | 1,435.8 | 1,396.2 | 1,417.7 | -1.2 | -10.4 | -1.3 |
| පටු මුදල් සැපයුම (M1) | 1,552.4 | 1,732.6 | 1,768.4 | 0.4 | 15.7 | 13.9 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 10,974.0 | 12,029.8 | 12,121.5 | 8.2 | 11.0 | 10.5 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 12,516.6 | 13,616.4 | 13,747.9 | 5.2 | 10.6 | 9.8 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් (ඇ) | -808.0 | 93.9 | 180.2 | 61.9 | 111.2 | 122.3 |
| මුදල් අධිකාරීන් | -963.0 | -248.0 | -236.9 | 40.3 | 74.6 | 75.4 |
| වාණිජ බැංකු | 155.0 | 342.0 | 417.2 | 130.4 | 144.5 | 169.1 |
| දේශීය බැංකු ඒකක (DBUs) | -388.2 | -245.0 | -221.0 | 30.8 | 27.4 | 43.1 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 543.2 | 587.0 | 638.2 | 955.3 | 23.0 | 17.5 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම් (ඇ) | 13,324.6 | 13,522.4 | 13,567.7 | -5.0 | 2.9 | 1.8 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ) | 8,261.0 | 8,154.6 | 8,088.9 | 23.4 | 0.5 | -2.1 |
| මහ බැංකුව | 3,178.6 | 1,864.2 | 1,825.8 | 2.7 | -40.3 | -42.6 |
| වාණිජ බැංකු | 5,082.4 | 6,290.4 | 6,263.2 | 41.1 | 26.1 | 23.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 4,782.8 | 6,132.1 | 6,102.4 | 53.4 | 30.6 | 27.6 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 299.7 | 158.2 | 160.8 | -38.3 | -45.5 | -46.4 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය | 1,103.0 | 701.2 | 709.4 | -36.2 | -35.6 | -35.7 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,048.4 | 647.8 | 655.3 | -31.3 | -37.7 | -37.5 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 54.6 | 53.4 | 54.1 | -73.1 | 10.5 | -0.9 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,072.7 | 7,437.9 | 7,512.4 | -8.3 | 6.3 | 6.2 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,552.7 | 6,904.1 | 6,961.0 | -6.1 | 6.1 | 6.2 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 520.0 | 533.8 | 551.4 | -29.5 | 8.4 | 6.0 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -3,112.2 | -2,771.2 | -2,743.0 | -47.0 | 9.3 | 11.9 |









## 2.3 සංචිත මුදල් හා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල්

(රුපියල් මිලියන)

| | 2024-08-22 | 2024-08-29 |
|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,505,504.40 | 1,488,009.79 |

| | 2024-08-23 | 2024-08-30 |
|---|---|---|
| සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් (රුපියල් මිලියන) | 1,311,806 | 1,303,456 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක්ෂණ මුදල් වෙළඳපොළ | 2024-08-26 | 2024-08-27 | 2024-08-28 | 2024-08-29 | 2024-08-30 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 8.57 | 8.56 | 8.57 | 8.52 | 8.75 (ඈ) |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 9.60 | 1.80 | 5.20 | 2.26 | 0.03 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2024-08-26 | 2024-08-27 | 2024-08-28 | 2024-08-29 | 2024-08-30 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 8.70 | 8.70 | 8.71 | 8.74 | 8.65 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 63.85 | 65.00 | 49.64 | 37.92 | 41.23 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2024-08-26 | 2024-08-27 | 2024-08-28 | 2024-08-29 | 2024-08-30 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,556 | 2,556 | 2,556 | 2,556 | 2,556 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,419 | 1,419 | 1,419 | 1,418 | 1,418 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව
(ඈ) අද දින ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි වාර්තා වී ඇත්තේ එක් ගණුදෙනුවක් පමණි

## 2.6 විවෘත වෙළඳ කටයුතු

| අයිතමය | 2024 අගෝස්තු 26 | 2024 අගෝස්තු 27 | | 2024 අගෝස්තු 28 | 2024 අගෝස්තු 29 | 2024 අගෝස්තු 30 |
|---|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 30.00 | 30.00 | 40.00 | 20.00 | 25.00 | 30.00 |
| කාල සීමාව (දින ගණන) | 1 | 1 | 7 | 1 | 1 | 3 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 19.68 | 17.13 | 64.00 | 20.66 | 28.48 | 28.36 |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 19.68 | 17.13 | 40.00 | 20.00 | 25.00 | 28.36 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 8.46 | 8.36 | 9.05 | 8.31 | 8.36 | 8.45 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 8.60 | 8.60 | 9.11 | 8.68 | 8.60 | 8.65 |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 8.52 | 8.49 | 9.08 | 8.48 | 8.47 | 8.53 |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | | |
| පියවීමේ දිනය | | | | | | |
| පරිණත වන දිනය | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පියවීමේ දිනය | | | | | | |
| පරිණත වන දිනය | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පියවීමේ දිනය | | | | | | |
| පරිණත වන දිනය | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 117.906 | 103.281 | | 125.405 | 127.686 | 140.012 |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 0.100 | 0.000 | | 0.693 | 0.000 | 0.609 |
| | | | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **98.131** | **46.151** | | **104.712** | **102.686** | **111.043** |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)[අ]** | **58.131** | **46.151** | | **64.712** | **62.686** | **71.043** |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු

### 2.7.1 ණය කාඩ්පත්[අ]


| | 2023 දෙසැම්බර් | 2024 ජූනි | 2024 ජූලි [ආ] |
|---|---|---|---|
| මුළු සක්‍රීය කාඩ්පත් ගණන | 1,917,085 | 1,923,503 | 1,922,668 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 10,768 | 10,275 | 10,197 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,906,317 | 1,913,228 | 1,912,471 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 151,373 | 150,151 | 149,695 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 35,838 | 34,554 | 34,338 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 115,534 | 115,597 | 115,357 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[ඇ]


| | 2023 දෙසැම්බර් | 2024 ජූනි | 2024 ජූලි [ආ] |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන [ඈ] | 1.3 | 1.4 | 1.4 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) - රු. බිලියන | 0.7 | 0.9 | 0.9 |

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද (ආ) තාවකාලික
(ඇ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සපයන ලද දත්ත මත පදනම්ව
(ඈ) වසරේ මේ දක්වා එකතුව

වාණිජ පත්‍රිකා නිකුතු (සමුච්චිත)





ණය කාඩ්පත් - නොපියවූ ශේෂය




## 2.8 කොටස් වෙළඳපොළ

| | 2023-08-31 | 2024-08-23 | 2024-08-30 |
|---|---|---|---|
